Regional Friendships Newsletter– April 2023

## ප්‍රාදේශීය මිතුදම් ගොඩනැගීම

2023 ආරම්භවූයේ අප අභිරක්ෂක කණ්ඩායමේ සන්දේවි හැන්ඩි සහ රිවෙල් මාර්සලින්, සිංගප්පූරු කලා කෞතුකාගාරය (SAM) සංවිධානයකරන EX-SITU: Art Spaces Residency සඳහා 2023 ජනවාරි 10 සිට පෙබරවාරි 6 දක්වා සහභාගීවීමට සිංගප්පූරුව බලා පිටත්වීමෙනි.

අපගේ ප්‍රධාන අභිරක්ෂක ශාර්මිණී පෙරේයිරා සහ සංවර්ධන සහායක ඔනෙලා පෙරේරා, අප ආදි කර්තෘ අනුග්‍රාහකයන් කණ්ඩායමක් පෙබරවාරි මාසයේදී නව දිල්ලියේදී පැවති India Art Fair සහ Asia Arts Game Changer Awards 2023 සඳහා කැටුව ගියහ. සිය සංචාරය අතරතුර මෙම අනුග්‍රාහකයෝ කිරන් නඩාර් කලා කෞතුකාගාරය සහ KHOJ ඇතුළු කලා සහ සංස්කෘතික ආයතනක කිහිපයක මෙන් ම, ඉන්දියානු කලා අනුග්‍රාහකයන්ගේ පෞද්ගලික එකතු සහ නිවාසවල ද සංචාරය කළහ. ඉදිරි වසර තුළ තවත් ජාත්‍යන්තර කලා චාරිකා සඳහා අපි උද්යෝගයෙන් බලාසිටිමු!

මාර්තු මාසයේදී, අධ්‍යාපන හා මහජන වැඩසටහන් සහාය අභිරක්ෂක ප්‍රමෝදා වීරසේකර, ඉන්දියාවේ බැංගලෝර්හි කලා හා ඡායාරූප කෞතුගාරය (MAP) 2023 මාර්තු 24–25 දක්වා සංවිධානයකළ 'Beyond Theory: Mapping Feminist Practices in the Contemporary' නමැති සම්මේලනයේදී කතාකළා ය.

## ඉදිරියට සහ ඉහළට

ජනවාරි සහ මාර්තු අතර MMCA ශ්‍රී ලංකා MMCA Afterschoolහි 2 සහ 3 වාර ළමුන් 60 දෙනෙකුගේ සහභාගීත්වයෙන් සාර්ථකව පැවැත්වූයේ ය. තව ද, කාන්‍යා ද අල්මේදාගේ මෙහෙයවීමෙන් අපගේ ප්‍රථම ලේඛන වැඩමුළුව මාර්තු 4–12 දක්වා සැසි හතරක් ලෙස අපි පැවැත්වීමු. පෞද්ගලික හා දේශපාලනික දෑ ගැන ලිවීමට මගපෙන්වීම සහ අනුප්‍රාණය සොයන සියලු ම මට්ටම් සහ ශෛලවල ලේඛකයන් සඳහා අභිරක්ෂණයවූ මෙම වැඩමුළුවට 13 දෙනෙකු සහභාගීවිය. 'මුණගැසීම්හි' තෙවන වටමාරුවේ ප්‍රදර්ශිත කලාකෘතිවලට ප්‍රතිචාරයක් ලෙස ඔවුන් ගොඩනැගූ ස්ව-රචනා බලාපොරොත්තුවන්න!

'මුණගැසීම්' නමැති අපගේ දෙවන ප්‍රදර්ශනය මාර්තු 19 අවසන් විය. නරඹන්නන් 20,866 පැමිණි මෙම ප්‍රදර්ශනය ක්‍රෙස්කැට් බුලෙවාර්ඩ්හී අපගේ රැඳීම තහවුරු කිරීමටත්, අප ක්‍රියාකාරකම් නව ප්‍රේක්ෂකයන් වෙත ගෙන ඒමටත් උපකාරී විය. අප ප්‍රධාන අභිරක්ෂක ශාර්මිණී පෙරේයිරා සහ අභිරක්ෂක සන්දේවි හැන්ඩි විසින්

අභිරක්ෂණයකළ 'මුණගැසීම්' වටමාරු තුනකින් සමන්විතවූ අතර, රට පුරා සහ බර්ලිනයේ වෙසෙන කලාකරුවන් 15 දෙනෙකුගේ කුලියට ගත් කලාකෘති 59 එහි ප්‍රදර්ශනය කෙරිණි. එම කලාකෘති පිළිබඳ වැඩි විස්තර අපගේ වෙබ් අඩවියෙන් ඔබට ළඟදී ම ලබාගත හැක. 'මුණගැසීම්' ඉතා සාර්ථක ලෙස ඉදිරිපත්කිරීමට අපට උදව්කළ කලාකරුවන්, කලාකෘති කුලියට දෙන්නන්, අරමුදල් සපයන්නන්හට බෙහෙවින් ස්තුතිවන්ත වෙමු!

MMCA ශ්‍රී ලංකා, කාන්තාවන්ට සංස්කෘතික ව්‍යවසායකත්වය, නායකත්ව සංවර්ධනය, සහ මූල්‍ය කළමනාකරණ කුසලතා හා අවස්ථා ලබාදීමට අරමුදල් රැස්කිරීමේ ව්‍යාපාරයක් Selyn ආයතනය සහ Selyn පදනම සමග ආරම්භකළේ ය. මෙම සහයෝගීතාවය, Design for Impactහි කොටසක් ලෙස නිර්මාණිත ජෝර්ජ් කීට්ගේ (1901–1993) සිතුවම් දෙකකින් ආභාසිත සරම් සහ සළු සීමිත සංස්කරණ මාලාවක් හඳුන්වා දෙයි. මෙම සුවිශේෂී අත්කම් ඇඳුම් කලා ලෝලී සියල්ලන් ම එකතුකළ යුතු ඒවායි! එයින් එකක් ලබාගැනීමට ඔබටත් අවශ්‍ය ද? Facebook හෝ Instagram හරහා අප හා සම්බන්ධවන්න.

අපගේ මීළඟ ප්‍රදර්ශනයවන 'ආගන්තුකයෝ' 2023 මැයි 4 විවෘතවන බව අපි මහත් උද්යෝගයෙන් දැනුම්දෙන්නෙමු. සන්දේව් හැන්ඩි සහ ශාර්මිණී පෙරේයිරා අභිරක්ෂණයකරන මෙම ප්‍රදර්ශනය සමකාලීන කලාකරුවන් මත නාභිගතවන අතර, සිතුවම්, ඡායාරූප, අභිවහන, වීඩියෝ කලාකෘති, සහ චිත්‍ර ආදී කලාකෘති 16ක් එකට එක්කරයි. ඔබේ දිනපොත් ලකුණුකර තබාගන්න— ඉක්මනින් ඔබව දැකීමට අපි මගබලා ඉන්නෙමු!

2023 මැයි 4 විවෘතවන ප්‍රදර්ශනයට කෞතුකාගාර පරිශ්‍රය සුදානම්කරන බැවින්, ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය දැනට මහජනයාට වසා ඇත.